

# කම්ලා බාසින් සම්මානය
# ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාවය දකුණු ආසියාව පුරා ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම වෙනුවෙන්

මෙම සම්මානය සෑම වසරකම දකුණු ආසියාවේ පුද්ගලයින් දෙදෙනෙකු වෙත පිරිනැමෙන අතර එය:

- දකුණු ආසියාවේ සාම්ප්‍රදායික නොවන ජීවනෝපායන්වල යෙදෙන සහ ප්‍රගුණ කරන කාන්තාවන් ඇගයීම සඳහා සම්මානයක් සහ.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය වෙනුවෙන් කටයුතු කරන පුරුෂයින් ඇගයීම සඳහා සම්මානයක්

සම්මාන කාණ්ඩ දෙකටම ජසි සහ සංක්‍රාන්ති ලිංගික පිරිමි සහ කාන්තාවන් ඇතුළත් වේ.

සම්මානය සමන්විත වන්නේ :
ඉන්දියානු රුපියල් 100,000 ක ත්‍යාග මුදලක් සමග කුසලානයක්.

සම්මානලාභීන්ට දකුණු ආසියාව පුරා සේවය කරන වෙනස් කිරීමේ නියෝජිතයන්, සංවිධාන, පරිත්‍යාගශීලීන්ගෙන් සම-ඉගෙනීම සඳහා, සම්බන්ධ වීමට සහ ජාලගත වීමට මෙය හොඳ අවස්ථාවක් වනු ඇත

## අයදුම් කළ හැක්කේ කාටද?

දකුණු ආසියාවේ ඕනෑම රටක පදිංචිව සිටින සහ සේවය කරන එනම් ඇෆ්ගනිස්ථානය, බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පකිස්ථානය සහ ශ්‍රී ලංකාව යන දකුණු ආසියාතික පුරවැසියන්ට අපි අයදුම් කිරීමට ආරාධනා කරමු.

රටවල් අටේ සියලුම නිල භාෂාවලින් අයදුම්පත් භාරගනු ලැබේ.

## සම්මාන කාණ්ඩ

1. සාම්ප්‍රදායික නොවන ජීවනෝපායක යෙදෙන සහ ප්‍රගුණ කරන කාන්තා (cis/සංක්‍රාන්ති ලිංගික) වෘත්තිකයෙක්.
2. පිරිමි ළමුන්/පුරුෂයින් සමග වැඩ කිරීමෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවී සාධාරණත්වයට සරිලන පරිසර පද්ධතියක් සක්‍රීය කිරීමට කටයුතු කර ඇති පිරිමියෙක් ( cis/සංක්‍රාන්ති ලිංගික)

## තෝරාගැනීමේ නිර්ණායක

### 1 වන කාණ්ඩය

- පසුගිය වසර 3 තුළ ඇයගේ/ඔවුන්ගේ සන්දර්භය තුළ සම්ප්‍රදායික නොවන ජීවනෝපායක් ප්‍රගුණ කිරීම
- ඇයගේ/ඔවුන්ගේ ඉපැයීම් පමණක් නොව, ඇයගේ/ඔවුන්ගේ ජීවිතයද පාලනය කර ගැනීමට ඇය/ඔවුන් සවිබල ගන්වා ඇත
- වෙනස් කිරීමේ නියෝජිතයෙකු වන අතර අන් අයට අවස්ථා නිර්මාණය කරයි

සාම්ප්‍රදායික නොවන ජීවනෝපායන් යනු කිසියම් කුලයකට, ප්‍රජාවකට, ආගමික කණ්ඩායමකට අයත් වීම හෝ ඔවුන්ගේ ලිංගික නැඹුරුව, ඔවුන්ගේ ලිංග අනන්‍යතාවය, ආබාධිතභාවය, ඔවුන්ගේ වාසස්ථාන (මෙම ලැයිස්තුව තව දිගු විය හැකි අතර - ඕනෑම සමාජයක පවතින වෙනස්කම් කර සැලකීමේ ව්‍යුහයන් මත පදනම්ව වෙනස් විය හැක) යන මෙම හේතු නිසා කාන්තාවන් සීමා කෙරන ඔවුන් වටා ඇති වීදුරු සිවිලිම නැතහොත් කොන්ක්‍රීට් සිවිලිම් සහ බිත්ති කඩා දමන ජීවනෝපායන්ය.. වැටුප් නොලබන වැඩ සහ ගමනාගමනය වටා ඇති ස්ත්‍රී පුරුෂ සමාජභාවී සම්මතයන් නිදසුනක් වශයෙන්, කාන්තාවන්ට දිවා කාලයේ සහ රාත්‍රියේ විශාල වශයෙන් නිවසින් බැහැරව සිටීමට අවශ්‍ය වන රිය පැදවීම හෝ පෙදරේරු වැනි රැකියා කිරීමට ඉඩ නොදීමට එක් හේතුවක් වී ඇත.

ඔබට මෙම සබැඳිය ක්ලික් කිරීමෙන් සාම්ප්‍රදායික නොවන ජීවනෝපායන් සහ කලාපය වටා ඇති උදාහරණ කිහිපයක් ගැන වැඩිදුර කියවිය හැක.

2 වන කාණ්ඩය

- පසුගිය වසර 5 තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සාධාරණත්වය සපිරි ලෝකයක් කරා පිරිමි ළමුන්/පුරුෂයින් සමඟ වැඩ කිරීම.
- රැකවරණ කටයුතු සඳහා දායක වීම, කාන්තා නායකත්වය පිළිගැනීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජ-සංස්කෘතික සම්මතයන් සියල්ලටම එරෙහිව සටන් කිරීම මගින් පුද්ගලික සහ රැකියා ජීවිතයේ හානිකර ආරූඪ කරගත් පිරිමිකම/පුරුෂාධිපත්‍යයට එරෙහි වීම.
- වෙනස් කිරීමේ නියෝජිතයෙකු වන අතර ස්ත්‍රී පුරුෂ සමාජභාවී සාධාරණත්වය සපිරි ලෝකයක් සක්‍රීය කිරීමට අනෙකුත් පිරිමින්ට බලපෑම් කර ඇත.

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා පිරිමි ළමයින් හා පුරුෂයින් සම්බන්ධ කර ගැනීම වර්ධනය වන ව්‍යාපාරයකි. කම්ලාගේ සටන් පාඨය වන "යහපත් තත්ත්වයේ මිනිසුන් සමානාත්මතාවයට බිය නැත" යන පාඨය පුරුෂාධිපත්‍ය සම්මතයන්ට, පුරුෂයින් අභියෝග කිරීමේ වැදගත්කම ඉස්මතු කරයි. මෙම කාණ්ඩය තම ජීවිත තුළ පීතෘමූලික පිළිවෙත් පරීක්ෂා කර, ඔවුන්ගේ වරප්‍රසාද පිළිගෙන, පුරුෂාධිපත්‍යයේ සීමා සහිතකම හඳුනාගෙන සිටින පුරුෂයින් පිළගැනීම අරමුණු කරයි. හානිකර භාවිතයන්ට මුහුණ දීමට, කාන්තාවන්ට සහ ලිංගික සුළුතරයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට විරුද්ධ වීමට, නිවසේ රැකවරණ කටයුතු සඳහා වගකීම බෙදා ගැනීමට සහ කාන්තාවන්ට සහ සංක්‍රාන්ති ලිංගික පුද්ගලයන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් ඉල්ලා සිටීමට සහය දැක්වීමට වෙනත් පුරුෂයින් සමඟ ක්‍රියාකාරීව වැඩ කරන පුරුෂයින් අපි සොයන්නෙමු. අපගේ ඉලක්කය වන්නේ මෙම වෙනස් කිරීමේ නියෝජිතයින්ට එකිනෙකාගෙන් ඉගෙන ගැනීමට සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය වෙනුවෙන් පෙනී සිටීමට අන් අයව පොළඹවා ගැනීමට උපකාරක පරිසරයන් ඇති කිරීමයි.

## කාලරේඛාව

**2024 මාර්තු 8:** අයදුම් කිරීමේ ක්‍රියාවලිය විවෘත කිරීම
**2024 ජූනි 7:** අයදුම් කිරීමේ ක්‍රියාවලිය අවසන් කිරීම
**2024 ජූලි-අගෝස්තු:** අපේක්ෂකයින් තෝරා ගැනීමේ කෙටි ලැයිස්තුව සහ සම්මුඛ පරීක්ෂණය
**2024 සැප්තැම්බර්:** ජයග්‍රාහකයින් නිවේදනය කිරීම
**නොවැම්බර් 30:** නවදිල්ලියේ සම්මාන උළෙල පැවැත්වීම

## සම්මානය පිළිබඳව

මෙම සම්මානය දකුණු ආසියාවේ ස්ත්‍රීවාදී ව්‍යාපාරවල ප්‍රතිමූර්තියක් වන කම්ලා භාසින් සිහි කිරීම සඳහාය. ඇය සාම්ප්‍රදායික නොවන ජීවනෝපාය මූලාශ්‍රවල නිරත වන කාන්තාවන්ගේ ප්‍රබල ආධාරකාරියක් වූවාය. කමලා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සඳහා පිරිමින් සමඟ සම්බන්ධ වීමේ අවශ්‍යතාවය ගැන උද්දේශනය/යෝජනා කළ අතර "ගුණාත්මක පිරිමින් සමානාත්මතාවයට බිය නැත" යන ජනප්‍රිය සටන් පාඨය ඉදිරිපත් කළේය.

## ජූරි සභාව

අනු අග (ඉන්දියාව), බින්ද පාණ්ඩේ (නේපාලය), කුෂි කබීර් (බංගලාදේශය), මුනිසා ජහන්ගීර් (පකිස්ථානය), නමිටා බන්ඩරෙ (ඉන්දියාව), රාධිකා කුමාරස්වාමි- ජූරි සභාපති (ශ්‍රී ලංකාව)

## සම්මානයේ හවුල්කරුවන්

අසාද් පදනම, iPartner ඉන්දියාව සහ ඉන්දියාව වෙනුවෙන් ජාතික පදනම

සම්මානය පිළිබඳ වැඩිදුර විස්තර සඳහා කරුණාකර www.kamlabhasinawards.org වෙත පිවිසෙන්න

Azad Foundation PARTNER INDIA भारतीय प्रतिष्ठान NATIONAL FOUNDATION FOR INDIA